# ලංසු සඳහා ආරාධනයයි

## දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

## වාරිමාර්ග අමාත්‍යාංශය

## (ජාතික තරගකාරී ලංසුකරණය)

**IFB අංකය : CRIWMP/NCB/VIS/2024 පැකේජ 1 සහ 2 සිට**

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ රත්මලේ එල්ලංගාවෙහි ග්‍රාමීය වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම සඳහා ලංසු කැඳවීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, UNDP ප්‍රතිත නියෝජිතායතනය හා සමග හරිත දේශගුණ අරමුදල් වෙතින් දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) සඳහා ප්‍රදානයක් ලබා ඇති අතර, මෙම අරමුදල් වලින් කොටසක් පහත දක්වා ඇති කොන්ත්‍රාත් යටතේ ගෙවීම් කිරීම සඳහා යොද ගනු ඇත. දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ (CRIWMP) ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව වෙනුවෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පහත ලැයිස්තුගත කොන්ත්‍රාත් පැකේජ සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| පැකේජ අංකය | පැකේජය පිළිබඳ විස්තරය | IFB අංකය | ලංසු ඇපකරය (රු.) | CIDA ශ්‍රේණිය | ආසන්න ඇස්තමේන්තුව (රු. මිලියන) |
|---|---|---|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කය, හොරොව්පොතාන ප්‍රා. ලේ. කොට්ඨාසය රත්මලේ එල්ලංගාව (Cascade) (පැකේජ 02 යි) | | | | | |
| 1 | අලුත්ගම වැව ග්‍රාමීය වැව පුනරුත්ථාපනය කිරීම | CRIWMP/NCB/ RATH/2024/01 | 400,000.00 | C5 සිට C4 | මි. 27.2 |
| 2 | කුඩාඋල්පත්වැව හා මීගහල්පත් වැව ග්‍රාමීය වැව් පුනරුත්ථාපනය කිරීම. | CRIWMP/NCB/ RATH/2024/02 | 450,000.00 | C5 සිට C4 | මි. 30.2 |

02. වැව් බැම්ම සකස් කිරීම, වාන් සොරොව්වේ ව්‍යුහයන් ඉදිකිරීම (ප්‍රධාන වැඩ) හා අමුණ ඇතුලු සම්පූර්ණ කාර්යයන් දින 120 ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය.

03. ලංසු මූලිකව කොන්ත්‍රාත් පැකේජ වශයෙන් ඇගයෙනු ඇත. ලංසුකරුවන්ට එක් පැකේජයකට හෝ වැඩි ගණනකට ලංසු ඉදිරිපත් කිරීමට නිදහස ඇත. එක් කොන්ත්‍රාත් පැකේජයකට වඩා ලංසු ඉදිරිපත් කරන විටදී ඉහත සඳහන් පරිදි ලංසු ඇපකර වෙන්වෙන්ව ඉදිරිපත් කළ යුතු අතර, එක් එක් කොන්ත්‍රාත් පැකේජය සඳහා සුදුසුකම් / යෝග්‍යතා උපමානයන් ඒ සඳහා ඇති යන්ත්‍ර සූත්‍ර උපකරණ සම්පත් ආදිය පිළිබඳ විස්තරද, වෙන්වෙන්ව දැක්විය යුතුය. අවසාන ඇගැයීමේ ක්‍රියාපටිපාටිය තුළ ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාරාත්මකව ඇගැයූ ලංසු පැකේජවල සමස්ත එකතුව, ව්‍යාපෘතිය සඳහා වඩාත් ලාභදායී සංයෝජනය තීරණය කිරීම සඳහා සලකා බැලෙනු ඇත. ලංසු ලංසුකරුවන්ගේත් සමස්ත ධාරිතාව සහ සුදුසුකම්/ යෝග්‍යතා උපමානයන් වෙත් කළ සම්පත් මත පදනම්ව ඇගයෙනු ඇත.

04. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

05. අභිලාෂී ලංසුකරුවන්ට රිසි නම්, ලංසුකරණ ලිපිලේඛන ලබා ගැනීමට පෙර CRIWMP කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර, වැඩිදුර විස්තර වාරිමාර්ග අමාත්‍යාංශයේ CRIWMP ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැකිය. ඇමතුම් අංක 0112672223 සහ විද්‍යුත් තැපැල **tendercriwmp@gmail.com**.

06. සුදුසුකම් පිළිබඳ විස්තරාත්මක අවශ්‍යතාවයන් ලංසුකරණ ලිපිලේඛනයන්හි ලබාදී ඇති අතර, ප්‍රධාන සුදුසුකම් කිපයක් පහත සඳහන් පරිදි වේ.

    අ) ලංසුකරුවන්ට ඉහත වගුවේ දක්වා ඇති පරිදි වාරිමාර්ග හා ජලාපවහන ඇලමාර්ග ක්ෂේත්‍රයේ ශ්‍රේණි සඳහා CIDA (ICTAD) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

    ආ) ඉදිකිරීම් පළපුරුද්ද : පසුගිය වසර දහය තුළ සමාන ස්වභාවයේ කොන්ත්‍රාත් අඩු තරමින් එකක්වත් සාර්ථකව නිමා කර තිබීමේ විශේෂිත පළපුරුද්ද.

07. කොන්ත්‍රාත්කරුගේ ව්‍යාපාරික ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් CRIWMP ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් හා ශ්‍රීලරු. 5,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, කොළඹ 10, ටී. බී. ජායා මාවත, නො. 500, 12 වන මහල, වාරිමාර්ග අමාත්‍යාංශයේ CRIWMP කාර්යාලයෙන් 2024.02.29 දින සිට 2024.03.20 දින දක්වා කාර්යාල වේලාවන් තුළ (09.00 පැය සිට 15.00 පැය දක්වා) ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

08. ලංසු, ලංසු විවෘත කිරීමේ දිනෙන් පසු දින 90 ක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, වාරිමාර්ග අමාත්‍යාංශයේ CRIWMP ව්‍යාපෘති අධ්‍යක්ෂ නමට නිකුත් කළ ඉහත පළවන (1) ඡේදයේ සඳහන් වටිනාකමට ලංසු ඇපකරයක් ලංසු සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) / රක්ෂණ නියාමන කොමිෂන් සභාව පිළිගත් වාණිජ බැංකුවක් / රක්ෂණ සමාගමක් (සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම හැර) මගින්, ලංසුකරණ ලිපිලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.

09. ලංසුකරු, ලංසුවේ මුල්පිටපත හා අනු පිටපත ඇතුළත් කවර දෙකක ඇතුලු කොට මුද්‍ර, තැබූ "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස සලකුණු කොට ලංසු අංකය වම් ඉහළ කෙළවරේ සඳහන් කළ මුද්‍ර, තැබූ කවරයක බහාලිය යුතුය. එක් පැකේජයකට වැඩි ගණනකට ලංසු ඉදිරිපත් කරන විටදී එක් එක් පැකේජය සඳහා එවන් ලිපි කවර වෙන්වෙන්ව සකස් කොට එම කවර සියල්ලම එක් "ප්‍රධාන ලිපිකවරයක" (Master Envelope) ඇතුළත් කළ යුතුය. ඉදිරිපත් කළ සියලුම පැකේජ සඳහා "ප්‍රමුඛතා ලැයිස්තුවේ පිළිවෙළ" (Order of Preference) ලංසුකරුවන් විසින් යථා පරිදි අත්සන් කොට "ප්‍රධාන ලිපි කවරය" තුළ ඇතුළත් කළ යුතුය.

10. ඉහත හත්වන (7) ඡේදයේ සඳහන් ලිපිනයේදී 2024.03.13 දින 1030 පැයට ආරම්භව පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත. අපේක්ෂිත ලංසුකරුවන්ට පූර්ව ලංසු රැස්වීමට සහභාගි වීමට පෙර තමන්ගේම වියදමින් ස්ථානීය චාරිකාවක යෙදී වැඩබිම පරීක්ෂා කොට බලා ලංසු පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබාගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

11. යථා පරිදි සම්පූර්ණ කළ ලංසු 2024.03.21 දින 14.00 පැයට හෝ ඊට පෙර කොළඹ 10, ටී. බී. ජායා මාවත, නො. 500, 12 වන මහල, වාරිමාර්ග අමාත්‍යාංශයේ CRIWMP ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය. නැතහොත් ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරෙන අතර, ලැබී ඇති ලංසු, ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොන්ත්‍රාත්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ඉහත 7 වන ඡේදයේ සඳහන් ලිපිනයේදී විවෘත කරනු ලැබේ.

12. ලංසු පිළියෙල කිරීමෙහි හෝ ඉදිරිපත් කිරීමෙහි ලා ලංසුකරුවන් විසින් දරණු ලබන කිසිදු පිරිවැයක් පිළිබඳව ගැනුම්කරු වගකියනු නොලැබේ.

**සභාපති, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව වෙනුවෙන්,**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)**
**වාරිමාර්ග අමාත්‍යාංශය,**
**12 වන මහල, නො. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.**